විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක **11/2014 (සංශෝධන I)**

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2016.06.13

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම සරල කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.</u>**

2014.08.26 දිනැතිව මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 11/2014 හා බැදේ.

02. එම චක්‍රලේඛයේ 03 වන ඡේදය මඟින් තැපැල් කාර්යාලය හරහා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කිරීමේදී පෙර පරිදිම pay outlet schedule යැවීම සිදුකළ යුතු බව දන්වන ලදී.

03. තැපැල් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගෙවීම් කරනු ලැබූ ක්‍රියාවලිය 2016 ජුනි මස සිට පහත සඳහන් ආකාරයට සිදුකිරීමට කටයුතු කර ඇත.

I. මේ වන විට තැපැල් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ගෙවීම් පත් තැපැල් කාර්යාල වෙත යොමු කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුවූවත්, **2016 ජුනි මාසයේ සිට එම තැපැල් කාර්යාල මඟින් සිදු කරන ගෙවීම් සඳහා ගෙවීම් උපදෙස් තැපැල් දෙපාර්තමේන්තුව හරහා මධ්‍යගත පද්ධතිය මඟින් මෙහෙයවීමට කටයුතු කරනු ලැබේ.**

II. **එබැවින් සෑම මාසයකම ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ තැපැල් කාර්යාලය මඟින් විශ්‍රාමිකයාට සිදු කරන ගෙවීම් වලට අදාළව ගෙවීම් පතක් (Pay outlet) 2016 ජුනි මාසයෙන් පසුව ප්‍රාදේශීය ලේකම් විසින් තැපැල් හා උප තැපැල් කාර්යාල වලට යැවීම අවශ්‍ය නොවේ.**

III. තැපැල් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය මුදල් හා උපදෙස් මෙම මස සිට තැපැල් දෙපාර්තමේන්තුව වෙත සෘජුවම යොමු කරන අතර තැපැල් දෙපාර්තමේන්තුව මඟින් අදාළ මුදල් තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල වෙත යොමු කරනු ඇත.

IV. තැපැල් කාර්යාල මඟින් විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමයේ කිසිදු වෙනස්වීමක් මෙමඟින් සිදු නොවන අතර ගෙවීම් කළමනාකරණ ක්‍රමවේදය පමණක් වෙනස් කර ඇත.

V. තැපැල් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම් සිදුකිරීමේදී සෑම මසකම ගෙවීම් කිරීමට අදාළ තොරතුරු දත්ත පද්ධතියට යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් බිහිදොර (DS Portal) දත්ත පද්ධතියට ප්‍රවේශ වීම මඟින් එම යාවත්කාලීන කරන ලද දත්ත පරීක්ෂා කළ යුතුය.

VI. එක් එක් මාසයට අදාළ නොගෙවූ විශ්‍රාම වැටුප් තැපැල් දෙපාර්තමේන්තුව විසින් නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරනු ඇත. **යම් හේතුවක දී විශ්‍රාමිකයෙකුට තම මාසික විශ්‍රාම වැටුප එම මාසය තුළදීම ලබා ගැනීමට නොහැකි වුවහොත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පෙර පරිදිම දැනුම් දිය යුතුය.**

**VII.** තැපැල් කාර්යාල මඟින් ගෙවන විශ්‍රාම වැටුපට අදාළව සිදුකළ යුතු පහත කළමනාකරණ කටයුතු එපරිද්දෙන්ම ඔබගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතු බව කාරුණිකව දන්වමි.

**a.** විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නොහැකි අවස්ථාවක දී විශ්‍රාම වැටුප් ලබන්නා වෙනුවට විශ්‍රාම වැටුප ලබා ගැනීමට වෙනත් පුද්ගලයකු නම් කිරීම.

**b.** නොගෙවූ විශ්‍රාම වැටුප් වලට අදාළව ගෙවීම් සඳහා ආකෘති පත්‍ර යොමු කිරීම.

**c.** විශ්‍රාමිකයාගේ ඉල්ලීම අනුව විශ්‍රාම වැටුප හා ගෙවීම් සිදුකරනු ලබන කාර්යාලයන් වෙනස් කිරීම.

**d.** විශ්‍රාමිකයාට අදාළව ලිපිගොනු සම්බන්ධව සිදුකළ යුතු අනෙකුත් කටයුතු.

**VIII.** වැඩිමනත් විස්තර සඳහා පහත සඳහන් දුරකථන අංකයන් හා සම්බන්ධ විය හැකිය.

a. තැපැල් දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ උපකාරක සේවාව

දුරකථන අංක : 011-2542104, 011-2335978,011-2334728
Fax : 0114628130
Email : info.it@slpost.lk.

b. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

දුරකථන අංක : 011-2209881
ක්ෂණික ඇමතුම් : 1970
Fax : 011-2391403

c. අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරී

**IX.** මෙය රජයේ ප්‍රමුඛ දෙපාර්තමේන්තු දෙකක් එක් වී තොරතුරු තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් ක්‍රියාවලි ප්‍රති නිර්මාණය කරන ලද ප්‍රමුඛ අවස්ථාවක් වන අතර එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ සහයෝගය බලාපොරොත්තු වෙමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
3. ලේකම් - තැපැල්,තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය
4. තැපැල්පති - ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති - අ.ක.ස.